පරිච්ඡේදය

07

# ලාභ අරමුණු කර නොගත් සංවිධානවල අවසන් ගිණුම් පිළියෙල කිරීම

වර්තමානයේ ලාභ පරමාර්ථය කර නොගෙන පිහිටුවා ගන්නා ලද සංවිධාන බොහෝමයක් දැකිය හැකිය. මෙම සංවිධාන බොහෝමයක් ක්‍රියාත්මක වන්නේ සමාජ සුභසාධන අරමුණු පෙරදැරි කරගෙනය.

උදා:
- රාජ්‍ය නොවන සංවිධාන (NGOS)
- ක්‍රීඩා සමාගම්
- කුලගන සමිති
- මරණාධාර සමිති
- ප්‍රජා මූල්‍ය සමිති

මෙම පරිච්ඡේදයෙන් අප සාකච්ඡා කිරීමට අපේක්ෂා කරනුයේ මෙවැනි සංවිධානයක මූල්‍ය ප්‍රකාශන (අවසන් ගිණුම) පිළියෙල කරන ආකාරය පිළිබඳවයි. මෙවැනි ආකාරයේ සංවිධානයක පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශන වනුයේ,

1. **ආදායම් ප්‍රකාශය**
2. **ශේෂ පත්‍රය**

මෙම ප්‍රධාන මූල්‍ය ප්‍රකාශ 2 පිළියෙල කිරීම සඳහා මෙවැනි සංවිධාන පහත සඳහන් උපකාරක ගිණුම් පිළියෙල කරනු ලබයි.

**සාමාජික මුදල් ගිණුම (යාවජීව ගිණුම සාමාජික මුදල් ගිණුම ඇතුලුව)**
**ලැබීම් හා ගෙවීම් ගිණුම**

**විශේෂ අවස්ථා (Speacial Situation)**
ඇතැම් සංවිධාන තම සංවිධානයේ අරමුදල තර කර ගැනීමේ පරමාර්තයෙන් ආපනශාලා, සල්පිල්, වෙන්දේසි යනාදිය පවත්වනු ලබයි. මෙවැනි අවස්ථාවක එකී ආපනශාලාවේ ශුද්ධ ලාභය හෝ අලාභය තීරණය කිරීම සඳහා වෙනමම **"වෙළෙඳ ලාභාලාභ ගිණුමක්"** පිළියෙල කළ යුතුය.

පසුව එහි ශුද්ධ ලාභය හෝ අලාභ ආදායම් වියදම් ගිණුමට ගෙන යා යුතුය.

## ආදායම් ප්‍රකාශය - INCOME STATEMENT

ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාරයක ප්‍රධානම ආදායම් මාර්ගය වනුයේ "වර්ෂයට අදාල සාමාජිකයින්ගේ ගාස්තුවයි." (Members Fees) මීට අමතරව වර්ෂයේ වියදම ද ගලපා අතිරික්තය හෝ ඌණතාවය (Surplus or Defect) ගණනය කිරීම සඳහා ආදායම වියදම් ගිණුම පිළියෙල කරනු ලබයි.

**ආදායම් වියදම් ගිණුම**

| | | | |
|---|---|---|---|
| වියදම් | XXX | සාමාජික මුදල් | XXX |
| අතිරික්තය | XXX | | |
| | XXX | | XXX |

**සැ.යු.** තනි පුද්ගල ව්‍යාපාරයක ආදායම් ගිණුමට අදාල තාර්කික පදනම මෙහිදී ද යොදාගත යුතුය.

## ශේෂ පත්‍රය - BALANCE SHEET

මෙය තනි පුද්ගල ව්‍යාපාරයක ශේෂ පත්‍රයට බෙහෙවින් සමාන වේ. තනි පුද්ගල ව්‍යාපාරයක ශේෂ පත්‍රය තුළ ප්‍රාග්ධන ඇතුලත් කළ නමුත් මෙවැනි සංවිධානයක එය "**සමුච්චිත අරමුදල**" (Accumulated Fund) ලෙස හඳුන්වයි.

## සාමාජික මුදල් ගිණුම - MEMBERS FEE ACCOUNT

කාලපරිච්ඡේදය තුළ සංවිධානයේ සාමාජිකයින් ගෙන් ලද මුළු මුදලත්, කාලපරිච්ඡේදය අවසන් වන විට හිඟ සහ ඉදිරියට ලද සාමාජික මුදල් ප්‍රමාණය තීරණය කිරීම සඳහාත් සාමාජික මුදල් ගිණුම පිළියෙල කරනු ලබයි. මෙවැනි සාමාජික මුදල් ගිණුමක ආකෘතිය පහත පරිදි දැක්විය හැකිය.

**සාමාජික මුදල් ගිණුම**

| | | | | | |
|---|---|---|---|---|---|
| ඉ/ගෙ/ ශේෂය | ① | XXX | ඉ/ගෙ/ ශේෂය | ② | XXX |
| ආදායම් වියදම් ගිණුම | ⑥ | XXX | මුදලින් ලද සාමාජික මුදල් | ③ | XXX |
| ප/ගෙ/ ශේෂය | ⑤ | XXX | ප/ගෙ/ ශේෂය | ④ | XXX |
| | | XXX | | | XXX |
| ඉ/ගෙ/ ශේෂය | | XXX | ඉ/ගෙ/ ශේෂය | | XXX |

① - කාලපරිච්ඡේදය ආරම්භ වන විට ලැබිය යුතු සාමාජික මුදල් ප්‍රමාණය
② - කාලපරිච්ඡේදය ආරම්භය වන විට කලින් ලද සාමාජික මුදල
③ - වර්ෂයේ මුදලින් ලද සාමාජික මුදල
ලැබීම් ගෙවීම් ගිණුම හර
සාමාජික මුදල් ගිණුම බැර
④ - වර්ෂය අවසන් වන විට ඉදිරියට වර්ෂය සඳහා ලද සාමාජික මුදල් ප්‍රමාණය
⑤ - වර්ෂය අවසන් වන විට හිඟව පවතින සාමාජික මුදල් ප්‍රමාණය
⑥ - වර්ෂයට අදාල සාමාජික මුදල් ආදායම
සාමාජික මුදල් ගිණුම හර
ආදායම් වියදම් ගිණුම බැර

යම් අවස්ථා වලදී, මෙවැනි සංවිධානයක යාවජීව සාමාජිකයින් දැකිය හැකිය. (Life Time Members) එවැනි සාමාජිකයින් සඳහා යාවජීව සාමාජික මුදල් ගිණුම පිළියෙල කළ යුතුය.

**යාවජීව සාමාජික මුදල් ගිණුම**

| | | | | | |
|---|---|---|---|---|---|
| ආදායම් වියදම් ගිණුම | ② | XXX | ලැබීම් ගෙවීම් ගිණුම | ① | XXX |
| ප/ගෙ/ ශේෂය | ③ | XXX | | | |
| | | XXX | | | XXX |
| | | | ඉ/ගෙ/ ශේෂය | | XXX |

① - වර්ෂයේ මුදලින් ලද යාවජීව සාමාජික ගාස්තු
② - වර්ෂයට අදාල යාවජීව සාමාජික ගාස්තු
= (යාවජීව සාමාජික මුදල x යාවජීව සමාජිකයින් සංඛ්‍යාව)
③ - ඉදිරි වර්ෂ සඳහා අදාල යාවජීව සාමාජික මුදල් ප්‍රමාණය

## උදාහරණ – 45

2015/2016 කාලපරිච්ඡේදය තුළ සාමාජික ගාස්තු ආදායමට සම්බන්ධ පහත සඳහන් විස්තර **නිර්මලා ක්‍රීඩා සමාජයේ** පොත් වලින් උපුටා ගන්නා ලදී.

(1) සෑම සාමාජිකයෙකු විසින්ම රු. 1,000/- ක වාර්ෂික සාමාජික ගාස්තුවක් ගෙවිය යුතුය.
(2) පසුගිය වර්ෂය (2014/2015) සඳහා වූ හිඟ සාමාජික ගාස්තු රු. 20,000/- ක් ඇතුළුව කාලපරිච්ඡේදය තුළ ලැබුණු සාමාජික ගාස්තු රු. 240,000/- කි.
(3) සාමාජිකයන් 30 ගෙන් 2015/2016 වර්ෂය සඳහා සාමාජික මුදල් හිඟ හිට ඇති අතර සාමාජිකයන් 20 දෙනෙකු විසින් 2016/2017 වර්ෂය සඳහා වූ සාමාජික ගාස්තු මෙම වර්ෂය තුළ (2015/2016 ) ගෙවන ලදී.
(4) සාමාජිකයන් 04 දෙනෙකු යුරෝපයේ පදිංචිය සඳහා සංක්‍රමණය (Migrate) වී ඇති අතර 2014/2015 වර්ෂය සඳහා ඔවුන්ගෙන් ලැබිය යුතු සාමාජික ගාස්තු ලියා හැරිය යුතුය.

**ඔබ විසින්,**
2015/2016 වර්ෂය සඳහා සාමාජික ගාස්තු ගිණුම පිළියෙල කිරීම සහ 2015/2016 කාලපරිච්ඡේදය සඳහා සාමාජික ගාස්තු ආදායම ලෙස ආදායම් හා වියදම් ගිණුමට මාරු කළ යුතු මුදල පෙන්වීම කළ යුතුය.

**(ලකුණු 06)**

## උදාහරණ – 46

ක්‍රීඩා සමාජයක සාමාජික සංඛ්‍යාව 100 කි. සාමාජිකයෙකුගේ වාර්ෂික සාමාජික ගාස්තුව රු. 10/- කි. වර්ෂය තුළදී සාමාජිකයන්ගෙන් රු. 1,050/- ක මුදලක් සාමාජික ගාස්තු වශයෙන් ලැබුණු අතර, එහි පසුගිය වසර සඳහා සාමාජිකයන් 10 දෙනෙකුගෙන් ලැබුන මුදල් ද, ඊළඟ වසර සඳහා සාමාජිකයන් 5 දෙනෙකුගේ මුදල් ද ඇතුලත් වේ. වර්ෂය අවසානයට ලැබිය යුතු සාමාජික ගාස්තුව වන්නේ:

## ලැබීම් ගෙවීම් ගිණුම

මෙය මුදල් පොත පිළියෙල කළ ආකාරයටම පිළියෙල කරන්න.

## උදාහරණ – 47

(A) රයිසින් ක්‍රීඩා සමාජයේ 2017.01.01 දිනට තත්ව විස්තරය පහත සඳහන් පරිදි වේ.

| වගකීම් | රු. | වත්කම් | රු. |
|---|---|---|---|
| සමුච්චිත අරමුදල | 440,000 | උපකරණ (ගෘහස්ථ ක්‍රීඩාගාරය) | 250,000 |
| ගෙවිය යුතු පුහුණුකරුවන්ගේ ගාස්තු | 20,000 | ලැබිය යුතු සාමාජික මුදල් | 70,000 |
| | | බැංකුවේ මුදල් | 140,000 |
| | 460,000 | | 460,000 |

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ ලැබීම් හා ගෙවීම් පහත සඳහන් පරිදි වේ.

| ලැබීම් | රු. | ගෙවීම් | රු. |
|---|---|---|---|
| බැංකුවේ ශේෂය | 140,000 | තරඟාවලි සඳහා තීන්ත ආලේප කිරීම | 160,000 |
| ඉකුත් වර්ෂය සඳහා සාමාජික මුදල් | 40,000 | ලිපිද්‍රව්‍ය හා තැපැල් ගාස්තු | 46,000 |
| ප්‍රවර්තන වර්ෂය සඳහා සාමාජික මුදල් | 280,000 | අළුත් උපකරණ - ක්‍රීඩාගාරය | 36,000 |
| ඊළඟ වර්ෂය සඳහා කලින් ලැබුණු සාමාජික මුදල් | 50,000 | ගොඩනැගිලි කුලී | 100,000 |
| ක්‍රීඩා සමාජ, ගෘහස්ථ ක්‍රීඩාගාර ඇතුලත්වීමේ ගාස්තු | 288,000 | පුහුණුකරුවන්ගේ ගාස්තු (2016 වර්ෂය සඳහා වූ රු. 20,000/- ඇතුළුව) | 80,000 |
| ක්‍රීඩා තරඟාවලි ප්‍රචාරණය කිරීමෙන් ලැබුණු මුදල් | 137,500 | පොදු වියදම් | 72,000 |
| | | තරඟාවලි සඳහා තීරක/ විනිසුරුවන්ගේ ගාස්තු | 200,000 |
| | | ශේෂය | 241,500 |
| | 935,500 | | 935,500 |

පහත සඳහන් අතිරේක තොරතුරු දී ඇත.

(1) ප්‍රවර්තන වර්ෂය සඳහා සාමාජික මුදල් ලෙස රු. 36,000/- ක් ලැබිය යුතුය.

(2) ජනවාරි 01 දිනට උපකරණ වර්ෂයකට 20% බැගින් වර්ෂය සඳහා ක්ෂය කළ යුතුය.

(3) වර්ෂයකට වඩා වැඩියෙන් හිඟව ඇති සාමාජික මුදල් ලියා හැරිය යුතුය.

(4) අළුත් උපකරණ මිලදීගෙන ඇත්තේ 2017.12.31 දින දීය.

ඔබ විසින් 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්‍රීඩා සමාජයේ ආදායම් හා වියදම් ගිණුම් පිළියෙල කළ යුතුය.

**(ලකුණු 08)**

## උදාහරණ - 48

2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **ග්‍රීන් ක්‍රීඩා සමාජයේ** සංක්ෂිප්ත ලැබීම් හා ගෙවීම් ගිණුම පහත සඳහන් පරිදි වේ.

| ලැබීම් | රු. | ගෙවීම් | රු. |
|---|---|---|---|
| 2015.04.01 දින ශේෂය | 82,000 | වැටුප් (25% බීම හල සඳහා) | 108,000 |
| සාමාජික ගාස්තු ලැබීම් | 372,000 | බීම හලේ ගැණුම් | 242,000 |
| බීම හලේ විකුණුම් | 438,000 | මුද්‍රණ ගාස්තු හා ලිපිද්‍රව්‍ය | 12,200 |
| ඇතුලත්වීමේ ගාස්තු | 32,600 | ක්‍රීඩා පිට්ටනි සඳහා කුලී | 60,000 |
| | | ක්‍රීඩා උපකරණ | 75,000 |
| | | බීම හලේ වියදම් | 41,000 |
| | | ක්‍රීඩා සමාජ වියදම් | 132,200 |
| | | ඉදිරියට ගෙන ගිය ශේෂය | 254,200 |
| | 924,600 | | 924,600 |

**පහත සඳහන් අමතර තොරතුරු දී ඇත.**

(1) 2015.03.31 දිනට වූ ශේෂ පත්‍රයෙන් ගන්නා ලද උධෘත:

(i) ස්ථාවර වත්කම් පොත් අගයන්ට:

| | රු. |
|---|---|
| • ක්‍රීඩා උපකරණ | 124,500 |
| • ලී බඩු හා සවි කිරීම් | 84,200 |
| • බීම හලේ උපකරණ | 148,500 |

(ii) බීම හලේ තොග රු. 42,000

(iii) හිඟ සාමාජික ගාස්තු රු. 8,000 (කලින් ගෙවූ සාමාජික ගාස්තු නැත)

(2) 2016.03.31 දිනට බීම හලේ ඉතිරි තොගය රු. 48,000/- කට අගය කර ඇත.

(3) 2016.03.31 දිනට සාමාජික ගාස්තු පිළිබඳ තත්ත්වය:

| | රු. |
|---|---|
| • හිඟ සාමාජික ගාස්තු | 12,000 |
| • කලින් ගෙවූ සාමාජික ගාස්තු | 8,000 |

(4) ස්ථාවර වත්කම් හීනවන ශේෂ ක්‍රමයට අනුව පහත සඳහන් අනුපාත යටතේ ක්ෂය කල යුතුය.

- ක්‍රීඩා උපකරණ සහ බීම හලේ උපකරණ වර්ෂයකට 20% බැගින්
- ලී බඩු සහ සවි කිරීම් වර්ෂයකට 10% බැගින්

(5) 2016.03.31 දිනට උපචිත වියදම් වූයේ:

| | රු. |
|---|---|
| • බීම හල් වියදම් | 5,200 |
| • ක්‍රීඩා සමාජ වියදම් | 4,800 |

**ඔබ විසින්, පහත සඳහන් දෑ පිළියෙල කළ යුතුය.**

(a) බීම හල් ලාභ'ලාභ ගිණුම, සහ (ලකුණු 03)

(b) 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ග්‍රීන් ක්‍රීඩා සමාජයේ ආදායම් හා වියදම් ගිණුම (ලකුණු 07)

**(මුළු ලකුණු 10)**

## *උදාහරණ - 49*

**බිලු ස්ටාර් ක්‍රීඩා සමාජයේ** 2016 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලැබීම් සහ ගෙවීම් ගිණුම පහත දක්වේ.

| ලැබීම් | රු. | ගෙවීම් | රු. |
|---|---|---|---|
| ඉ/ගෙන ශේෂය | 16,000 | බෝල මිලට ගැනීම | 10,000 |
| සාමාජික ගාස්තු ලැබීම් | 45,800 | ක්‍රීඩා පිටිය සඳහා වූ කුලි | 7,000 |
| ආධාර මුදල් ලැබීම් | 70,000 | ප්‍රවාහන වියදම් | 2,000 |
| විවිධ ද්‍රව්‍ය විකුණුම් | 2,000 | සමාගම් කොටස්වල ආයෝජන | 15,000 |
| | | සේවක වැටුප් | 18,000 |
| | | ඉ/ගෙන ගිය ශේෂය | 81,800 |
| | 133,800 | | 133,800 |
| ඉ/ගෙනා ශේෂය | 81,800 | | |

**පහත අමතර තොරතුරු දී ඇත.**

(1) සාමාජික ගාස්තු

| | රු. |
|---|---|
| 2015.03.31 දිනට හිඟ මුදල් | 5,000 |
| 2016.03.31 දිනට හිඟ මුදල් | 8,000 |
| 2015.03.31 දිනට කලින් ලැබී තිබූ මුදල් | 3,000 |
| 2016.03.31 දිනට කලින් ලැබී තිබූ මුදල් | 6,000 |

(2) වර්ෂයකට අදාලා ක්‍රීඩා පිටි කුලි රු. 10,000/- ක්, සහ වැටුප් රු. 3,000/- ක් උපලබ්ධිතව ඇත.

(3) ලැබුණු ආධාර මුදල්, නව කාර්යාල ගොඩනැගිල්ලක් තැනීම සඳහා ලද රු. 68,000/- ක මුදලකින් සහ ඉතිරිය පොදු කටයුතු සඳහා ලැබුණු ආධාර මුදල් වලින් සමන්විත වේ. ගොඩනැගිලි තැනීමේ කටයුතු තවම ආරම්භ කර නැත.

(4) 2015.03.31 දිනට ඉතිරිව තිබූ බෝල තොගයේ වටිනාකම රු. 1,500/- ක්වූ අතර, 2016.03.31 දිනට අවසන් බෝල තොගයක් නොතිබුණි.

(5) 2015.03.31 දින සමුච්චිත අරමුදලේ ශේෂය රු. 19,500/- ක් විය.

**ඔබ විසින්,** පහත සඳහන් දෑ පිළියෙල කළ යුතුය.

(a) බිලු ස්ටාර් ක්‍රීඩා සමාජයේ 2016 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් සහ වියදම් ගිණුම **(ලකුණු 05)**

(b) එහි 2016 මාර්තු 31 දිනට ශේෂ පත්‍රය. **(ලකුණු 05)**

**(මුළු ලකුණු 10)**

## උදාහරණ - 50

**වික්ටෝරියා ක්‍රීඩා සමාජයේ** 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සාරාංශගත ලැබීම් සහ ගෙවීම් ගිණුම පහත පරිදි වේ.

| | රු. | | රු. |
|---|---|---|---|
| ආරම්භක මුදල් ශේෂය | 23,500 | කාර්යාල කුලිය ගෙවීම් | 63,500 |
| ලද සාමාජික මුදල් | 210,000 | බිම්හල් කුලිය ගෙවීම් | 58,000 |
| ලියාපදිංචි ගාස්තු | 3,000 | බිම්හල් බඩුතොග මිලදී ගැනීම් | 485,000 |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලැබීම් | 50,000 | බිම්හල් වැටුප් | 150,000 |
| බීම හලේ විකුණුම් වලින් ලැබීම් | 912,000 | කාර්යාල පොදු වියදම් | 7,000 |
| | | කාර්යාල වැටුප් | 128,000 |
| | | විදුලිය ගාස්තු | 12,000 |
| | | බීම හලෙහි වෙනත් වියදම් | 15,000 |
| | | ශේෂය ඉ/ගෙ | 280,000 |
| | 1,198,500 | | 1,198,000 |

**පහත දැක්වෙන අමතර තොරතුරු සපයා ඇත.**

| | | | රු. |
|---|---|---|---|
| (1) | 2015.04.01 දිනට ශේෂයන් | - හිඟ සාමාජික මුදල් | 4,000 |
| | | - කලින් ගෙවන ලද සාමාජික මුදල් | 2,000 |
| | 2016.03.31 දිනට ශේෂයන් | - හිඟ සාමාජික මුදල් | 3,000 |
| | | - කලින් ගෙවන ලද සාමාජික මුදල් | 6,000 |

(2) පිරිවැය රු. 100,000/- ක් වූ ස්ථාවර වත්කම් වසර තුළ විකුණා දමන ලදී. ඒවා විකුණු දිනට සමුච්චිත ක්ෂයවීම් රු. 70,000/- ක් විය.

(3) බීම්හල් සේවකයන්ගේ 2016 මාර්තු මාසය සඳහා වැටුප වූ රු. 15,000/- ක මුදල 2016.03.31 දිනට ගෙවිය යුතුව තිබුණි.

(4) බීමහල් බඩු තොග ශේෂ පහතාකාර විය.

| | රු. |
|---|---|
| 2015.04.01 දිනට | 8,000 |
| 2016.03.31 දිනට | 12,000 |

(5) 2016.03.31 දිනට බීමහලේ විකුණුම් වෙනුවෙන් රු. 13,500/- ක මුදලක් සාමාජිකයන්ගෙන් ලැබිය යුතුව තිබුණි.

(6) විදුලිය ගාස්තු වලින් 75% ක් බිම හලට අදාලවේ.

**ඔබ විසින් පහත ද පිළියෙල කල යුතුවේ.**

2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **වික්ටෝරියා ක්‍රීඩා සමාජයේ** ආදායම් සහ වියදම් ගිණුම බීම හල් ගිණුම වෙනම පෙන්නුම් කරන්න.

## උදාහරණ - 51

වෘත්තීය රැකියා සඳහා පුහුණු කිරීමේ පරමාර්ථයෙන් අවට ප්‍රදේශයේ තරුණ කොටස් ''දයට කිරුළ'' නමින් වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථානයක් 2016 අප්‍රේල් 01 වන දින ආරම්භ කරන ලදී. 2017 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු අදාළ වේ.

1. සාමාජික මුදල්

- සාමාජිකයෙකුගේ සාමාජික ගාස්තුව මාසිකව රු. 500 ක් වේ.
- 2017 මාර්තු 31 දිනට සිටී සාමාජිකයින් ගණන 150 කි.
- සාමාජිකයින් 40 දෙනෙක් ඊළඟ වර්ෂය සඳහා ද සාමාජික මුදල් ගෙවා තිබූ අතර තවත් සාමාජිකයින් 20 දෙනෙකු සාමාජික මුදල් ගෙවා නොමැත.
- ඇතුළත් වීමේ ගාස්තුව එක් සාමාජිකයෙකු සඳහා රු. 450 ක් විය.

2. පුහුණු කිරීම් කළමනාකරණය කිරීම.

- පළමු වැඩසටහන ලෙස ත්‍රෛයි මාසික සීඝ්‍රගාමී AAT පාඨමාලාව 2016/04/01 හඳුන්වා දෙන ලදී. මේ සඳහා සිසුන් 40 ක් ලියාපදිංචි වූ අතර පාඨමාලා ගාස්තුව එක් ශිෂ්‍යයෙකු සඳහා රු. 1200 ක් වේ. සියළු ශිෂ්‍යයන් නියමිත පරිදි මුදල් ගෙවා ඇත.
- දෙවන පාඨමාලාව ලෙස වරලත් ගණකාධිකරණ පාඨමාලාව හඳුන්වා දෙන ලදී. 2016/04/01 සිසුන් ලියාපදිංචිය ඇරඹූ අතර පාඨමාලාව 2016 සැප්තැම්බර් 01 වන දින ආරම්භ කරන ලදී. ශිෂ්‍ය පාඨමාලා ගාස්තුව රු.1500ක් වන අතර ශිෂ්‍යයන් 30 ක් ලියාපදිංචි වී තිබුණි. මින් සිසුන් 10 ක් සම්පූර්ණ පාඨමාලා ගාස්තු ගෙවා තිබුණි. තවත් සිසුන් 20 පාඨමාලා ගාස්තුවෙන් 50% පමණක් ගෙවා ඇත.
- පාඨමාලා පවත්වාගෙන යාමේ පහසුකම් සඳහා ගෙවූ වාර්ෂික මුදල රු.4000 කි.
- පාඨමාලා උපදේශකට ගෙවූ වැටුප රු. 15,000 ක් වූ අතර තවත් 5000 ක් ගෙවීමට තිබුණි.

3. මධ්‍යස්ථානය කළමනාකරණය කිරීම.

- රු. 400,000 ක් වටිනා කාර්යාල උපකරණ තොගයක් 2016 අප්‍රේල් 01 වන දින පරිත්‍යාගයක් ලෙස ලැබුණි. මෙම උපකරණ වර්ෂ 5 ක් ප්‍රායෝජනයට ගත හැකි වේ. මෙම පරිත්‍යාගය වර්ෂ 4 ක් තුළ ආදායමක් ලෙස හඳුනා ගැනීමට වැඩිදුරටත් තීරණය කරන ලදී.
- මධ්‍යස්ථානයේ කළමනාකරුට රු. 10,000 ක මාසික වැටුපත් ගෙවන අතර එය මසක් හිඟ ඇතිව ගෙවනු ලැබේ.

- කාර්යාල උපකරණ අළුත්වැඩියාව සඳහා වියදම රු. 20,000 ක් වූ අතර මින් ගෙවා ඇත්තේ රු. 15,000 ක් පමණි.
- වර්ෂය තුළදී රු. 45,000 ක් පුහුණු කිරීම් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලට ගත් අතර මින් 15,000 ක ද්‍රව්‍ය 2017 මාර්තු 31 දින වන විට ඉතිරි වී තිබුණි.
- අනෙකුත් ගමන් වියදම් හා වෙනත් වියදම් පිළිවෙලින් රු. 18,000 ක් හා 60,000 ක් විය.

**අවශ්‍ය වන්නේ,**

2017 මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා,

a) ලැබීම් හා ගෙවීම් ගිණුම

b) ආදායම් හා වියදම් ගිණුම

**(මුළු ලකුණු 10)**

## උදාහරණ – 52

2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **ෂැඩෝ සමාජ සංවිධානයේ** ලැබීම් හා ගෙවීම් පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| **ලැබීම්** | **රු.** |
| සාමාජික මුදල් ලැබීම් | 3,825,000 |
| ලද ආධාර මුදල් | 337,500 |
| අවුරුදු සාදය | 191,250 |
| බීම හලේ විකුණුම් | 6,075,000 |
| **ගෙවීම්** | |
| වරිපනම් | 202,500 |
| බීම හලේ ගැණුම් | 4,162,500 |
| පොදු වියදම් | 5,895,000 |
| අවුරුදු සාදයේ වියදම් | 33,750 |

**පහත සඳහන් අමතර තොරතුරු දී ඇත.**

| | **2016.03.31** | **2015.03.31** |
|---|---|---|
| හිඟව ඇති දායක මුදල් | 135,000 | 200,500 |
| කලින් ලැබුණු දායක මුදල් | 22,500 | 11,250 |
| හිඟව ඇති වරිපනම් | 112,500 | 101,250 |
| බීමහලේ තොග | 562,500 | 450,000 |
| සංවිධානයේ කාර්යාල උපකරණ- (පිරිවැය රු. 2,250,000) | 450,000 | 675,000 |
| බීමහලේ ගොඩනැගිලි - (පිරිවැය රු. 11,250,000) | 4,050,000 | 4,500,000 |
| ලැබීම් සහ ගෙවීම් ගිණුම | ? | 360,000 |

**ඔබ විසින්,**

1) 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බීමහල් ලාභාලාභ ගිණුම, (ලකුණු 03)

2) 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම (ලකුණු 05)

3) 2016 මාර්තු 31 දිනට ශේෂ පත්‍රය (ලකුණු 07)

**(මුළු ලකුණු 15)**

# ස්ව අධ්‍යයන අභ්‍යාස

① 2014-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොළඹ ටෙනිස් ක්‍රීඩා සමාජයේ භාණ්ඩාගාරික විසින් පිළියෙල කරන ලද ලැබීම් සහ ගෙවීම් ගිණුම පහත දී ඇති පරිදි විය.

| | රු. | | රු. |
|---|---|---|---|
| 2014-01-01 දිනට ශේෂය | 32,000 | මුද්‍රණ කිරීම් සහ ලිපි ද්‍රව්‍ය | 1,000 |
| ලැබුණු දායක මුදල් | | ටෙනිස් බෝල ආදිය මිලදී ගැනීම් | 8,600 |
| 2013 සඳහා 1,400 | | ස්ථාවර තැන්පතුව | 100,000 |
| 2014 සඳහා 102,000 | | බීමහලට මිලදී ගැනීම් සඳහා ගෙවීම් | 40,000 |
| 2015 සඳහා 300 | 103,700 | ටෙනිස් ක්‍රීඩාංගනය නඩත්තු කිරීම | 20,000 |
| පරණ ටෙනිස් බෝල විකුණුම් | 300 | පුහුණු කිරීම් ගාස්තු | 5,000 |
| බීමහලෙන් ලැබීම් | 105,000 | වැටුප් සහ වේතන - ටෙනිස් | 15,000 |
| ඇතුල්වීමේ ගාස්තු | 3,000 | බීමහලේ වැටුප් | 36,000 |
| | | අනිකුත් වියදම් | 2,100 |
| | | 2014-12-31 දිනට ශේෂය | 17,500 |
| | 245,200 | | 245,200 |

**පහත අතිරේක තොරතුරු සපයා ඇත.**

1. සාමාජික ගාස්තුව වර්ෂයකට රු. 100 කි. ඊළඟ වර්ෂයේ මාර්තු 31 දිනට පෙර යම් සාමාජිකයෙකු සාමාජික ගාස්තු නොගෙව්වහොත් ඔහු සාමාජිකත්වයෙන් ඉවත් කරන අතර හිඟ මුදල් කපා හරිනු ලැබේ.

2. හිඟව ඇති සහ කලින් ලැබුණු දායක මුදල් පහත දී ඇත.

| | **2013.12.31** | **2014.12.31** |
|---|---|---|
| හිඟව ඇති | 1,600 | 1,500 |
| කලින් ලැබුණු | 1,000 | 300 |

3. 2014-01-01 දින කාර්යාල උපකරණ කපාහල අගයට රු. 12,000 ක් විය. (පිරිවැය රු. 15,000) පිරිවැය මත වර්ෂයකට 10% බැගින් ක්ෂය ප්‍රතිපාදනය කරනු ලැබේ.

4. බිමහලේ විකුණුම් සහ ගැණුම් සම්පුර්ණයෙන්ම කරනුයේ ණයටය.

5. බීමහලේ ණයගැතියන් සහ ණයහිමියන් සහ බීමහලේ තොග පහත දී ඇත.

| | **2013.12.31** | **2014.12.31** |
|---|---|---|
| | **රු.** | **රු.** |
| බීමහලේ ණයගැතියෝ | 6,200 | 5,250 |
| බීමහලේ ණයහිමියෝ | 2,800 | 3,100 |
| බිමහලේ තොග | 21,000 | 23,000 |

6. ස්ථාවර තැන්පතුවට වර්ෂයකට 12% ක පොළියක් ලැබෙන අතර, එය ස්වයංක්‍රීයව තැන්පතුවට එකතු වේ.

**ඔබ විසින් පහත සඳහන් දෑ පිළියෙල කළ යුතුය.**

(a) 2014-12-31 දිනෙන් අවසන් වු වර්ෂය සඳහා බීමහලේ වෙළඳ ගිණුම

(b) 2014-12-31 දිනෙන් අවසන් වු වර්ෂය සඳහා ආදායම් සහ වියදම් ගිණුම

(c) 2014-12-31 දිනට ශේෂ පත්‍රය

② පහත දී ඇති 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලැබීම් හා ගෙවීම් ගිණුම, කුසුම් ක්‍රීඩා සමාජයේ භාණ්ඩාගාරික විසින් පිළියෙල කර ඇත. ක්‍රීඩා සමාජය ක්‍රීඩා උපකරණ විකිණීමේ ද නිරතව සිටී.

| ලැබීම් | මුදල රු. | ගෙවීම් | මුදල රු. |
|---|---|---|---|
| 2014-04-01 දිනට ප/ගෙ ශේෂය | 8,000 | වේතන | 99,000 |
| මුදල් | 190,000 | මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 7,500 |
| ක්‍රීඩා උපකරණ | 24,300 | උපකරණ අලුත් වැඩියාව | 5,000 |
| සැණකෙළි ලැබීම් | 8,200 | විකුණුම් වියදම් | 600 |
| | | සැණකෙළි වියදම් | 4,800 |
| | | ක්‍රීඩා උපකරණ මිලදී ගැණුම් | 40,000 |
| | | කාර්යාල උපකරණ මිලදී ගැණුම් | 15,000 |
| | | විවිධ වියදම් | 8,200 |
| | | ඉතිරි කිරීමේ තැන්පතු | 17,500 |
| | | ගමන් වියදම් | 5,400 |
| | | 2015 මාර්තු 31 දිනට ශේෂය | 27,500 |
| | 230,500 | | 230,500 |

පහත සඳහන් අතිරේක තොරතුරු සපයා ඇත.

1. වර්ෂය ආරම්භයේදී -2014-04-01-පැවති වත්කම් හා වගකීම් පහත සඳහන් පරිදි විය.

| | රු. |
|---|---|
| සාමාජිකයන්ගෙන් ලැබිය යුතු දායක මුදල් | 6,000 |
| කලින් ලැබුණ දායක මුදල් | 2,800 |
| කාර්යාල උපකරණවල අගය (පිරිවැය රු. 20,000) | 14,000 |
| ක්‍රීඩා උපකරණ (පිරිවැයට) | 50,000 |
| ඉතිරි කිරීමේ ගිණුම | 125,000 |
| ගොඩනැගිලි අරමුදල | 53,600 |
| ඒකාබද්ධ අරමුදල | 146,600 |

2. කාර්යාල උපකරණ පිරිවැය මත වර්ෂයකට 25% බැගින් ක්ෂය කෙරේ. මිලදී ගත් වර්ෂයේදී සම්පූර්ණ වර්ෂය සඳහා ක්ෂය අයකිරීම ක්‍රීඩා සමාජයේ ප්‍රතිපත්තිය වේ.
3. ඉතිරිකිරීමේ ගිණුම මත වර්ෂය අවසානයේදී ලැබිය යුතු රු 18,000 ක පොළිය පොත් වලට ඇතුළත් කළ යුතුය. (බදු නොසලකා හරින්න)
4. 2015.03.31 දිනට ලැබිය යුතු සාමාජික මුදල රු. 5,200 කි. එදිනට ක්‍රීඩා උපකරණ තොගය පිරිවැයට රු. 71,775 කි.

**ඔබ විසින් පහත සඳහන් දෑ පිළියෙල කරන්න.**

(a) 2015.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම
(b) 2015.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභාලාභ ගිණුම
(c) 2015.03.31 දිනට ශේෂ පත්‍රය

③ රන්තරු ක්‍රීඩා සමාජයේ 2015-03-31 දිනෙන් අවසන් වු වර්ෂය සඳහා වු ලැබීම් හා ගෙවීම් ගිණුම පහත දී ඇත.

| ලැබීම් | රු. | ගෙවීම් | රු. |
|---|---|---|---|
| 2014.04.01 දිනට ශේෂය | 3,000 | වැටුප් සහ වේතන | 45,000 |
| ලැබුණු දායක මුදල් | 100,000 | විදුලිය | 10,000 |
| සංගීත සංදර්ශනයෙන් ලැබුණු දළ ලැබීම් | 175,000 | සංගීත සංදර්ශන වියදම් | 130,000 |
| | | දුරකථන ගාස්තු | 8,000 |
| | | අනිකුත් වියදම් | 5,000 |
| | | ඉතිරි කිරීමේ ගිණුමේ තැන්පතු | 75,000 |
| | | 2015.03.31 දිනට ශේෂය | 5,000 |
| | 278,0000 | | 278,000 |

**පහත සඳහන් අතිරේක තොරතුරු ඔබ වෙත සපයා ඇත.**

1. 2014.04.01 දිනට වු වත්කම් සහ බැරකම් පහත පරිදි විය.

| | රු. |
|---|---|
| ලැබිය යුතු දායක මුදල් | 50,000 |
| (ඉදිරි වර්ෂය සඳහා) කලින් ලැබුණු දායක මුදල් | 10,000 |
| ඉතිරි කිරීමේ ගිණුම් ශේෂය | 115,000 |
| ගෙවිය යුතු විදුලිය හා බිල | 1,000 |
| ගොඩනැගිලි අරමුදල | 25,000 |
| අත ඇති මුදල් | 3,000 |
| ක්‍රීඩා උපකරණ - කපාහල අගයට | 60,000 |
| කාර්යාල උපකරණ - කපාහල අගයට | 35,000 |

2. කාර්යාල උපකරණ සහ ක්‍රීඩා උපකරණ හීනවන ශේෂය මත පිළිවෙලින් වර්ෂයකට 10% සහ 20% බැගින් ක්ෂය කළ යුතුය.
3. ක්‍රීඩා සමාජයේ රු. 1,000 ක වාර්ෂික සාමාජික මුදලක් ගෙවන සාමාජිකයින් 100 ක් සිටී. වර්ෂය අවසානයේදී සාමාජිකයින් 40 දෙනෙකුගේ සාමාජික මුදල් හිඟව තිබූ අතර කිසිම සාමාජිකයෙකු තම සාමාජික මුදල් (ඉදිරි වර්ෂය සඳහා) කලින් ගෙවා නොතිබුණි.
4. සංගීත සංදර්ශනයේ ශුද්ධ ලාභය ගොඩනැගිලි අරමුදලට බැර කල යුතුය.
5. 2015.03.31 දිනට උපචිත වියදම් පහත පරිදි විය.

| | රු. |
|---|---|
| විදුලිය | 2,000 |
| දුරකථන ගාස්තු | 3,000 |

6. 2015.03.31 දිනට ඉතිරි කිරීමේ ගිණුමේ ශේෂය රු. 200,000 විය. මෙහි වෙනසට හේතුව බැර කරන ලද පොළිය වේ.

**ඔබ විසින් පහත දෑ පිළියෙළ කරන්න.**

(a) 2015-03-31 දිනෙන් අවසන් වු වර්ෂය සඳහා ක්‍රිඩා සමාජයේ ආදායම් සහ වියදම් ගිණුම
(b) 2015-03-31 දිනට ක්‍රීඩා සමාජයේ ශේෂ පත්‍රය

④ "සටැන්නඩඩ් ක්‍රීඩා සමාජය" සාමාජිකයන් 1,500 කින් යුක්ත ක්‍රීඩා සංගමයකි. එහි භාණ්ඩාගාරික විසින් 2014 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා වූ ලැබීම් සහ ගෙවීම් පහත පරිදි පිළියෙල කර ඇත.

| | රු. '000 | රු. '000 |
|---|---|---|
| 2014.01.01 දිනට ශේෂය | | 125 |
| වර්ෂය තුල ලැබීම් | | |
| සාමාජික ගාස්තු | | 790 |
| ලැබුණ පරිත්‍යාග | | 185 |
| | | 1,100 |
| වර්ෂය තුළදී සිදුකළ ගෙවීම් : | | |
| කාර්ය මණ්ඩල වේතන, සේවා අර්ථ සාධක හා සේවා භාරකාර දායක මුදල් | 460 | |
| ස්ථාවර තැන්පතු | 100 | |
| දුරකථන | 30 | |
| විදුලිය | 28 | |
| බදු කුලී | 155 | |
| ජල බිල්පත් | 4 | |
| සාමාජික සුභසාධන වියදම් | 12 | |
| සාමාජිකයන්ට ගෙවූ මරණාධාර | 18 | |
| ණය ආපසු ගෙවීම් (පොළී සහිතව) | 75 | |
| ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම් | 50 | |
| පරිගණකයක් මිලදී ගැනීම | 85 | 1,017 |
| 2014-12-31 දිනට ශේෂය | | 83 |

**පහත දැක්වෙන අතිරේක තොරතුරු ද දී ඇත.**

1. සාමාජිකයෙකු සඳහා වූ වාර්ෂික සාමාජික ගාස්තුව රු. 500 කි. 2014-01-01 දිනට සාමාජිකයන් සියය (100) ක්, 2013-12-31 න් අවසන් වර්ෂය සඳහා වූ තම සාමාජික ගාස්තු ගෙවා නොතිබුණ අතර, සාමාජිකයන් දහය (10) ක් 2014-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කලින් සාමාජික ගාස්තු ගෙවා තිබුණි. 2014-12-31 දිනට, සාමාජිකයන් අනූව (90) ක් 2014-12-31 න් අවසන් වර්ෂය සඳහා වූ සාමාජික ගාස්තු ගෙවා නොතිබිණි. සාමාජිකයින් අසූව (80) ක් 2015 වර්ෂය සඳහා සාමාජික ගාස්තු 2014 වර්ෂය තුළදී ගෙවා තිබිණි.

2. පහත සඳහන් උපචිත වියදම් සැලකිල්ලට ගත යුතු වේ.

| | 2014.01.01 රු. 000 | 2014.12.31 රු. 000 |
|---|---|---|
| විදුලිය | 5 | 7 |
| බදු කුලී | 12 | 6 |
| දුරකථන | 3 | 4 |

3. 2014.01.01 සහ 2014.12.31 දිනයන්ට පහත සඳහන් වත්කම් හා වගකීම් ද තිබිණ.

| | 2014.01.01 රු. 000 | 2014.12.31 රු. 000 |
|---|---|---|
| මෝටර් රථ (ශුද්ධ) | 145 | 125 |
| ස්ථාවර තැන්පතු | 250 | 350 |
| බැංකු ණය | 150 | 90 |

**ඔබ විසින්,** පිළියෙල කළ යුතු වේ.

(a) 2014-12-31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, සහ
(b) 2014-12-31 දිනට ශේෂ පත්‍රය

⑤ වැවිලිකරුවන්ගේ සංගමයේ 2014 දෙසැම්බර් 31 දිනට වූ තත්ත්ව වාර්තාව (statement of affairs) පහත දැක්වේ.

| | | රු. | | රු. |
|---|---|---|---|---|
| සමුච්චිත අරමුදල | | 3,546,800 | **ස්ථාවර වත්කම් (පොත් අගය)** | |
| | | | ලී බඩු උපකරණ | 328,400 |
| පරිත්‍යාග | | 510,000 | ක්‍රීඩා උපකරණ | 210,800 |
| | | | ස්ථාවර බැංකු තැන්පතු | 3,420,000 |
| **ජංගම වගකීම්** | | | | |
| **උපචිත වියදම්** | | | **ජංගම වත්කම්** | |
| - විදුලි බිල් | 2,120 | | බිම්හලේ තොගය | 40,600 |
| - ටෙලිෆෝන් බිල් | 2,740 | 4,860 | ලැබිය යුතු සාමාජික මුදල් | 11,000 |
| ඉදිරියට ලද සාමාජික මුදල් | | 4,000 | විවිධ ණයගැතියෝ | 12,320 |
| විවිධ ණයහිමියෝ | | 18,200 | බැංකු සහ මුදල් | 60,740 |
| | | 4,083,860 | | 4,083,860 |

2015 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා වූ සාරාංශගත ගණුදෙනු පහතාකාර වේ.

| | රු. |
|---|---|
| **<u>මුදල් ලැබීම්</u>** | |
| වාර්ෂික සාමාජික මුදල් | 326,000 |
| ඇතුලත්වීමේ ගාස්තු රු. 1,500 බැගින් | 4,500 |
| පරිත්‍යාග | 180,000 |
| බීමහල් අලෙවිය | 732,600 |
| ණයගැතියන්ගෙන් ලද මුදල් | 111,020 |
| **<u>මුදල් ගෙවීම්</u>** | |
| බීමහල සඳහා ගැණුම් | 548,000 |
| බීමහලේ සේවක වැටුප් | 72,000 |
| සංගමයේ සේවක වැටුප් | 84,000 |
| විවිධ ණයහිමියනට ගෙවීම් | 118,200 |
| විදුලිය | 30,500 |
| ටෙලිෆෝන් | 42,560 |
| විවිධ වියදම් | 38,100 |
| ලී බඩු මිලට ගැනීම් | 50,000 |
| ක්‍රීඩා උපකරණ මිලට ගැනීම් | 40,000 |
| පුවත්පත් සහ සඟරා | 26,340 |

**වෙනත් තොරතුරු:**

(i) 2015/12/31 දිනට වූ බීම හල් බඩු තොගය පිරිවැයට රු. 50,400 ක් විය.

(ii) 2015/12/31 දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළිය රු. 348,000 ක් විය.

(iii) 2014/12/31 දිනට සාමාජිකයන් ගණන 308 ක් විය. එක් සාමාජිකයෙකු වෙනුවෙන් වාර්ෂික සාමාජික මුදල රු. 1,000 කි.

* 2015/12/31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ නව සාමාජිකයන් 3 දෙනෙකු බැඳුණි.
* මෙම වර්ෂය තුළදී ලද වාර්ෂික සාමාජික මුදල්වල පෙර වර්ෂය සඳහා ලැබිය යුතුව තිබූ සාමාජික මුදල් රු. 10,000 ක් ද ඇතුලත් වේ.
* 2003 වර්ෂය සඳහා සාමාජික මුදල් ගෙවීමට අපොහොසත් වූ එක් සාමාජිකයකුගේ සාමාජිකත්වය අහෝසි කරන ලද අතර, ඔහුගෙන් ලැබිය යුතුව තිබූ සාමාජික මුදල කපා හැරීමට ද තීරණය කරන ලදී.
* 2015/12/31 දිනට සාමාජිකයන් 3 දෙනෙකුගේ සාමාජික මුදල් හිඟව ඇති අතර, සමහර සාමාජිකයන් 2004 වර්ෂය තුළදීම 2005 වර්ෂය සඳහා ද සාමාජික මුදල් ගෙවා ඇත.

(iv) 2015/12/31 දිනට උපචිත ටෙලිෆෝන් බිල රු. 2,780 කි.

(v) ස්ථාවර වත්කම් පහත දැක්වෙන ප්‍රතිශතයක් මත හීන වූ ශේෂ ක්‍රමයට ක්ෂය කළ යුතු වේ.

* ලී බඩු හා උපකරණ : වසරකට 10%
* ක්‍රීඩා උපකරණ : වසරකට 50%

මිලටගත් වර්ෂය සඳහා ක්ෂය කරනු නොලැබේ.

(vi) බිම්හල් ණයට විකුණුම් සහ ණයට ගැණුම් පිළිවෙලින් රු. 105,000 සහ රු. 112,000 ක් විය.

**ඔබ විසින් පහත දෑ පිළියෙල කළ යුතුය.**

(a) බිම්හල් ලාභය හෝ අලාභය පැහැදිලිව පෙන්නුම් කෙරෙන ආකාරයට 2015/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංගමයේ ආදායම් සහ වියදම් ගිණුම.

(b) 2015/12/31 දිනට ශේෂ පත්‍රය.